දෙමාපියන් වෙත,

ඔබගේ  දරුවා අප දහම් නිකෙතනය දහම් පාසලට එවා මව් බස සහ දහම් දැනීම ලබා දීම සඳහා ඔබ දැක්වූ උනන්දුව අප ඉතා අගය කරමු.

මෙම කාර්ය භාර්ය සාර්ථක කරගැනීම සඳහා ඔබගේද සහාය  අපට අත්‍යාවශ්‍ය බව කිවයුතු අතර ඔබගේ දරුවා වෙනුවෙන් අප ලබාදෙන පොත්පත්, අවුරුදු තෑගි, පංති කාමර සහ වැසිකිලි පිරිසිදු කිරීම් සඳහා බරපැන පියවා ගැනීම  සඳහා $60.00 ගෙවිය යුතු අතර පන්සලේ සාමාජිකත්වයද ලබා ගැනීම අනිවාර්ය  වන අතර ( මසකට $10.00 ) මේ සඳහා 6 මසක සමාජික මුදල් එකවර ගෙවිය යුතුය.

පහත කරුණු පිළිබඳ ඔබගේ දැඩි අවධානය යොමු කරණු කැමැත්තෙමු.

- සැම ඉරිදාවකම සවස 4 ට පෙර දරුවා දහම්  පසලට ගෙන  ඒම. CAR PARK  .හො අතර මග දරුවා වාහනයෙන් බස්සවා පංතියට යාමට නොකියා ඔබ විසින් දරුවාව පංතිය වෙත රැගෙන යායුතුය. ( මෙය අනිවාර්ය බව සලකන්න. )
- සවස පවත්වන ගිලන්පස  බුද්ධ පූජාවට තම දරුවා සහභාගී කරවීම සහ මල් රැගෙන ඒමට දරුවාව උනන්දු කරවීම.
- පංතියේ කෙරෙන වැඩ ගැන සොයාබැලීම සහ ගෙදර වැඩ ගැන උනන්දු කරවීම.
- දහම් පාසලට පැමිනීමට පෙර පංතියේ පොත් පත් පෑන් පැන්සල්, වතුර බෝතලය, විවේක වේලාවේදී  කෑමට යමක් පමණක් බෑගය තුල තිබේදැයි බලන්න.
- 70% වත් පංති වලට සහභාගී නොවූ ළමුන් විශේෂ ක්‍රියාකාරකම් සඳහා සහභාගී නොකරගන්නා බව සලකන්න.
- දරුවාගේ  ඇඳුම පන්සලට සහ වයසට ගැලපෙන ලෙස  ( සුදු ළමා සාරිය  සහ සුදු කළිසම ) සකස් විය යුතුය. (සීත කාලයේදී මෙය වෙනස් කළ හැක )

තවද පළමු වාරය  අවසානයෙන් පසුව කුමන හේතුවක් නිසාවත් දරුවන් ඇතුලු කර නොගන්න බව සලකන්න. එසේම දහම් පාසැලේ කටයුතු පිළිබඳ ව හො වෙනත් යමක් පිළිබඳව හො සකච්චා කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා හමුවියයුත්තේ විහාරාධිපති හිමියන් බව කරුණාවෙන් සලකන්න.

ඔබගේ  දරුවාගේ  අනාගතය යහපත් කරණු වස් අප ගන්නා උතසාහයට ඔබගේ පූර්ණ සහාය ලැබෙනු ඇතැයි  අප තරයේ විශ්වාස කරමු.
තෙරුවණ් සරණයි.

විහාරාධිපති හිමි